# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2403/73 - 2024 සැප්තැම්බර් මස 28 වැනි සෙනසුරාදා - 2024.09.28**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය* : කඩු/ඉඩම්/03/194/MOD.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් පරවශතාවන් රජය වෙත පැවරී ඇති බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*රජයට පැවරී ඇති ඉඩමේ/පරවශතාවේ විස්තර* :-

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 479B ආසිරි උයන ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, පැලවත්ත ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් පිළියෙල කර ඇති ක.සි. 522025 හා 2024.07.24 දින දරන කඩඉම් සිතියමේ, කලාප අංක 2, පත්‍ර අංක 1 හි කැබලි අංක 1 - 2 ලෙස පෙන්නුම් කරන පහත විස්තර කෙරෙන ඉඩම් කැබලි :

01. **කැබලි අංක 01**
ඉඩමේ නම: ගොඩපොරගහවත්ත; ඉඩම් පරිහරණය: සිමෙන්ති කාණුව; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: අයි.එල්. රංජිත් තිලකසිරි; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0037.

02. **කැබලි අංක 02**
ඉඩමේ නම: ගොඩපොරගහවත්ත; ඉඩම් පරිහරණය: මාර්ගය; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: අයි.එල්. රංජිත් තිලකසිරි; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0020.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ **2024 ඔක්තෝබර් මස 14 වැනි දින පෙ.ව. 10.00** ට කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, **2024 ඔක්තෝබර් මස 07** වැනි දිනට මත්තෙන්, ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, ඒකී ඉඩම/පරවශ්‍යතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය. හිමිකම් පෑමට සහාය වන සියලුම ඔප්පු හා ලියවිලි පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

එච්. එස්. එස්. ඉඩම්ගොඩගේ,
ප්‍රාදේශීය ලේකම්,
කඩුවෙල.

2024 සැප්තැම්බර් මස 22 වැනි දින,
කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 09 - 0209



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*